The Journal of Studies in Humanities

Volume 5 (I) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# ගොවිජනපදකරණය තුළ බෞද්ධ භික්ෂුවගේ ආගමික කාර්යභාරය සහ බහුවාර්ගික සම්බන්ධතාවය: සේරුවිල ගොවිජනපදය ඇසුරින් කෙරෙන සමාජවිද්‍යාත්මක විශ්ලේෂණයක්

ඊ. එම්. සමන්ත ඒකනායක

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,

රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.

Email: em.samantha.e@gmail.com

**Abstract**

This paper investigates on role of Buddhist monk in colonization scheme of Seruvila in Trincomalee District. Numerous studies have been explored the contributions of Buddhist monks in relation to renaissance of Buddhism and socio-economic development. Since Buddhist monks have played prominent role in traditional Sri Lankan Society. It is obvious that in the British colonial period created completion between Buddhism and Christianity. In post-colonial period that completion transformed into Buddhism and Hinduism. This competition had been advanced with the colonization scheme of Eastern and Northern provinces.

Reverence Dhabagassare Sri Sumedhankara thero who visited the historical Buddhist sacred place in 1920s which was built by King Kawantissa. After observing of ruined monuments and Pagoda, the monk had decided to renovate the place and rebuild the Buddhist heritage society as stated in the historical evidence. Consequently, main objective of this paper was to explore in sociological point of view the role of Buddhist monk in relation to Buddhist renaissance and its impact on multi-ethnic relations.

**Keywords:** Buddhist monk, Buddhist heritage, post-colonial period, Trincomalee District

## හැඳින්වීම

වසර 2250 කට පමණ පෙර රුහුණු දනව්වේ රජ පැමිණි කාවන්තිස්ස රජු ත්‍රිකුණාමලයේ සේරු නම් විල කෙළවර වරාහ සොණ්ඩ නම් ස්ථානයේ මංගල නමින් චෛත්‍යයක් ගොඩනැගූ බැව් ධාතුවංශයෙහි සඳහන් වෙයි. එය සේරුවිල මංගල මහා චෛත්‍යය නමින් හැඳින්වෙන අතර එහි බුදුන් වහන්සේගේ ලලාට ධාතු පිහිටුවා ඇතැයි

සඳහන්වේ[1]. කාලයාගේ ඇවෑමෙන් මෙම චෛත්‍යය විනාශාභිමුඛයට පත් විය. ධාතුවංශයෙහි විස්තරය බලා එය වැඳපුදා ගැනීමට සේරුවිලට වැඩම කළ සුමේධංකර භික්ෂුවට දෘශ්‍යමාන වී ඇත්තේ විශාල පස් ගොඩක් පමණි. එයින් පශ්චාත්තාපයට පැමිණ ස්වකීය ජීවිත කාලය තුළදී මෙම චෛත්‍යය කෙසේ හෝ ප්‍රතිසංස්කරණය කිරීමට අධිෂ්ඨාන කළේය.

උන්වහන්සේගේ මෙම සම්ප්‍රාප්තිය හේතුවෙන් සේරුවිලට නව ජීවයක් ලැබී තිබේ. වෙසෙසින් මෙම භික්ෂුව අතින් රචිත පුවත්පත් ලිපි ලේඛන සහ ප්‍රදේශය සම්බන්ධයෙන් ලියැවී ඇති මූලාශ්‍ර භාවිතයට ගෙන භික්ෂුවගේ කාර්යය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයකට යොමුවන්නේ ගොවිජනපද ක්‍රියාවලියක දී භික්ෂුවකගේ කාර්යභාරය මෙහිදි පැහැදිලිවන බැවිනි. එමගින් බෞද්ධ භික්ෂුවගේ ආගමික කාර්යභාරය බහුවාර්ගික සම්බන්ධතාවය කෙරෙහි ධනාත්මකව (Positively) සහ ඍණාත්මකව (Negatively) බලපෑම කෙරෙහි මෙම පර්යේෂණ ලිපිය මගින් අවධානය යොමුකෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂනයේ දී ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත වශයෙන් තොරතුරු ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රාථමික දත්ත ක්ෂේත්‍රයෙන් රැස්කිරීමට පළමුව මාතෘකාවට අදාළ සාහිත්‍ය විමර්ශනය කළෙමි. ඒ අනුව පර්යේෂණ කෘති, සඟරා, පුවත්පත් සහ තවත් විවිධ මූලාශ්‍රයන් මගින් ගොඩ නැගුවෙමි. මෙම අධ්‍යනයේ දී ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ඉහතින් සඳහන් කරන ලද සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරාගතිමි. දත්ත රැස්කිරිම සඳහා සමාජවිද්‍යා හා සමාජ මානවවිද්‍යා ක්‍රමවේදයට අනුව පර්යේෂණ ශිල්පීයක්‍රම (Research techniques) කිහිපයක් භාවිත කළෙමි. එක් පර්යේෂණ ශිල්පීයක්‍රමයක් භාවිත කිරීමෙන් ඇතිවන අගතිගාමී තත්වය මඟහරවා ගැනීම මෙහි පරමාර්ථය විය. ඒ අනුව සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interviews) සහභාගිත්ව නිරීක්ෂණය (Participant Observation) මූලික තොරතුරු සපයන්නන් (Key Informants) සහ ප්‍රත්‍යෙක අධ්‍යයන (Case Studies) ක්‍රමවේ ද භාවිත කළෙමි.

## දත්ත විශ්ලේෂණය

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගේ යටත් විජිතයක් (1815) වීමෙන් අනතුරුව ක්‍රිස්තියානි ආගම සහ බෞද්ධ ආගම අතර තරගකාරිත්වයක් ගොඩ නැගුණි. පංච මහා වාද එහි ප්‍රතිඵලයක් බැව් අපි දනිමු. එහිදී බහු ආගමික (Multi-religion) සංස්ථාවන් තුළින් සිංහල බෞද්ධ අනන්‍යතාවය වෙන්කර තහවුරු කරගැනීමට අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර, මාර්ටින් වික්‍රමසිංහ වැන්නවුන් ක්‍රියාකොට තිබේ. පසුකලෙක විශේෂයෙන් අනගාරික ධර්මපාලතුමාගේ මතවාද ක්‍රියාවට නැන්වීමට විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් භික්ෂූහු ක්‍රියා කළහ. ධර්මපාලතුමාගේ මතවාදයන් භික්ෂු ජීවිතයට ආකාර කිහිපයකින් බලපෑවේය. (Seneviratne 1999).

---

1. "සේරුවිල මංගල මහා චෛත්‍යය පුරා වෘතය පිළිබඳ පැරණි මතයන් අලලා දහතුන් වන සියවසෙහි රචනා කරන ලද ධාතු වංශයෙහි ලලාට ධාතුව සේරුවිල නිධන් කොට ඇති බව නියත වශයෙන් පැවසේ. ධාතු වංශය නම්, ඇත්ත වශයෙන්ම ලලාට ධාතු වංශයයි. මෙසේ හෙයින් නුවර අවධියෙහි කරන ලද යම් යම් භක්ති කාව්‍යවල එන ප්‍රවෘත්තිවලට වඩා ධාතු වංශයෙහි එන පුවත් ඉහලින් පිළිගත හැකි බව කිව යුතුය," (ගොඩකුඹුර 1960).

1. නිද්‍රාශීලී භික්ෂු සමාජය විසිවන සියවසේ පිබිදවීම
2. 1930-40 දී ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය අවබෝධකර ගැනීම
3. 1940-1970 දක්වා කාලසීමාව තුළ සංස්කෘතික ප්‍රබෝධය ගොඩනැන්වීම
4. වර්තමාන භික්ෂූන් මුහුණපාන කලබලකාරී ස්වභාවය

තවද සෙනෙවිරත්නයන් පවසන්නේ ධර්මපාලතුමාගේ මතවාදයෙන් සජීවීකරණය වූ භික්ෂූන් වහන්සේ සමාජයේ ආගමික, සංස්කෘතික සහ සංවර්ධන යන ත්‍රිවිධ අංශයන්හි වර්ධනයට කටයුතුකොට ඇති බවයි. ධර්මපාලතුමාගේ සමාජ පුණර්ජීවන කාර්යයේ පුරෝගාමී සංස්ථාව වූයේ ද භික්ෂුන් වහන්සේය (1999).

ගමෙන් නගරයට පැමිණි භික්ෂූන් විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන්හි අධ්‍යාපනය ලබා ධර්මපාලයන්ගේ සමාජ පුණර්ජීවන කාර්යයේ පුරෝගාමීන් ලෙස කටයුතු කොට තිබේ. එහිදී විද්‍යාලංකාර භික්ෂූන් ජාතිකත්වය සහ සංස්කෘතික පුනර්ජීවනයටත්, විද්‍යෝදය භික්ෂූන් ග්‍රාමීය සංවර්ධනයටත් දායක වී තිබේ. එම භික්ෂූන් අතර කළුකොන්දයාවේ පඤ්ඤාසේකර (1895-1977), හීනැටියාන ධම්මාලෝක (1900-1981), සහ හෙන්දියාගල සීලරතන (1913-1982) ප්‍රධාන වේ.

සේරුවිල ප්‍රදේශයේ ගොවිජනපද ව්‍යාපාර ඇති කිරීම, ආගමික, සමාජීය, සංස්කෘතික සහ ග්‍රාම සංවර්ධනය උදෙසා කටයුතුකොට ඇති සුමේධංකර භික්ෂුන් වහන්සේ ද (1892-1984) ඉහත සඳහන් භික්ෂූන් වහන්සේගේ සමකාලීනයෙකි. විද්‍යෝදය හෝ විද්‍යාලංකාරය පිරිවෙන්හි අධ්‍යාපනය නොලැබුවද ධර්මපාලතුමා විසින් ආරම්භකරන ලද සිංහල බෞද්ධයා පුවත්පතට නිරන්තරයෙන් ලිපි ලියමින් ධර්ම ප්‍රචාරණය කරමින්, සමාජ සංස්කෘතික පුණර්ජීවනය ඇතිකිරීමටත්, ග්‍රාම සංවර්ධනයටත් උරදී තිබේ. මෙවැනි සාක්ෂි මඟින් ඔහු ද ධර්මපාල මතදාරියෙක්යයි තහවුරු කරවයි. කෙසේ වුවද ගොවිජනපද සම්බන්ධයෙන් උන්වහන්සේගේ දායකත්වය මෙහිදී වඩාත් වැදගත් වේ.

### දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර ස්වාමීන් වහන්සේ[2]

රුහුණු රට මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව බද දික්වැල්ල නම් නියම්ගම් බද තංගල්ල නගරයට නුදුරු දඹගස්ආර නම් ගමෙහි 1892 දෙසැම්බර් මස නව වන දින උපත ලබන ලදි. මධ්‍යම පාංතික පවුලක් වන මාවැල්ලේ රත්නවීර පටබැඳිගේ දොන් මෙන්දියස් සහ දඹගස්ආරේ ඔලොක්කුවේ පටබැඳිගේ නෝනච්චොහාමි යුවලට දාව උපන් මොහු 1904 අගෝස්තු මස දහවන පුරපසලොස්වක ලත් පොහෝ දින දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහා විහාරස්ථානයේ දී දෙවිනුවර සිරි ධම්මරතන මාහිමියන් වහන්සේගේ ආචාර්යත්වයෙන් දඹගස්ආරේ සුමේධංකර නමින් පැවිදි දිවියට එළඹ තිබේ. මොහු වසර

2 උන්වහන්සේගේ සමාජ මෙහෙවර ජනවාර්ගික සම්බන්ධතා කෙරෙහි කවරාකාරයෙන් බලපා තිබෙන්නේ දැයි විමර්ශනය කිරීමේ දී ජීව දත්ත පිළිබඳව ද යම් අවබෝධයක් ලබා ගැනීමට උත්සුක වූයේ මූලික සමාජානුයෝජන පරිසරය පුද්ගල පෞරුෂත්වයට සෘජුවම බලපාන බැවිනි. මෙම තොරතුරු 1984 අගෝස්තු මස 19 වන දින සේරුවිල පවත්වන ලද සුමේධංකර ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවයේ දී ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද පත්‍රිකාවකිනි. සම්පාදක ගිංතොට අනෝමදස්සී ස්ථවීර 1984.

හතේදී අකුරු කියවීමට නාකුළුගමුවේ සප්තබෝධි විහාරාධිපතිව විසූ කල්‍යාණිවංශික භදන්ත ශ්‍රී තංගල්ලේ ශ්‍රී පඤ්ඤානන්ද නාහිමියන්ට භාර කොට තිබේ. සුමේධංකර භික්ෂුව පාසැල් අධ්‍යාපනයක් නොලබා පැරණි සම්ප්‍රදායික පන්සල් අධ්‍යාපනය පමණක් ලැබූවෙකි. තලල්ලේ නාඔටුන්නේ ලංකා රජමහා විහාරාධිපතිව වැඩ විසූ දෙව්නුවර සිරි ධම්මරතන හිමියන්ගේ ආචාර්යත්වයේ සාමණේර බණදහම් ප්‍රගුණ කොට දසවසර පිරී පැවිදි කරවීමට කටයුතු සලසන ලදි. එබැවින් 1904 අගෝස්තු 10 පුර පසළොස්වක ලත් පොහෝ දින දඹගස්ආරේ සුමේධංකර නමින් පැවිදි කරවන ලදි.

1909 මැයි මාසයේ දී දෙව්නුවර සිරි ධම්මරතන හිමියෝ ස්වකීය කුඩා සුමේධංකර නම ද කැටුව තිරාණගම සුමනාරාමයේ වස් විසූහ. උන්වහන්සේ වෙතින් උගත බණ දහම් පූර්ණය කර වැඩි දුර අධ්‍යාපනය සඳහා දොඩන්දූවේ ශෛලබිම්භාරාමාධිපති සරස්වති මණ්ඩප පිරිවෙණාධිශ්වර අළුත්ගම ශ්‍රී සීලක්ඛන්ද ස්වාමීන් වහන්සේට සුමේධංකර සාමණේරයාණන් වහන්සේ භාර කළහ. එතැන් පටන් සතලොස් වසක් ම ධර්ම විනය ශබ්ද ශාස්ත්‍ර ප්‍රගුණ කළහ. විසිවසක් සපිරුණු සුමේධංකර ස්වාමීන් වහන්සේ ධර්ම විනය හා ශබ්ද ශාස්ත්‍රාවබෝධයෙහි මහා ප්‍රගුණත්වයක් ඇතිව සිටි බැවින් 1913 දී දොඩන්දූවේ ශෛලබිම්බාරාමාසන්න උදකුක්චෙ‍්‍ය සීමා මාලකයේ දී ශ්‍රී කල්‍යාණිවංශ මහා සංඝයා වහන්සේ වෙතින් උපසම්පදාව ලැබූහ.

සේරුවිලට සම්ප්‍රාප්ත වන සුමේධංකර හිමියෝ රටේ ප්‍රසිද්ධ භික්ෂුවක් බවට පත් වන්නේ නැගෙනහිර සිංහල බෞද්ධ පුනර්ජීවය ඇති කරමින් ප්‍රදේශ සංවර්ධන කිරීමට උරදුන් අයෙකු ලෙසිනි. සිංහල, දෙමළ, ඉංග්‍රිසි, පාලි සහ සංස්කෘත භාෂා හැසිරවීම පිළිබඳ හසල දැනුමකින් යුතු මෙම භික්ෂුව ධර්ම කථිකයෙක් ලෙසින් ප්‍රචලිතය. සිංහල බෞද්ධයින්ට පමණක් නොව දෙමළ බසින් දෙමළ වැසියන්ට ද ධර්මය දේශනා කිරීමෙන් ඒ බව පැහැදිලි වේ. දේශපාලනික සබඳතා තුළින් නැගෙනහිර ප්‍රදේශය තුළ සිංහල බෞද්ධ ජනතාව නගා සිටුවීමට ක්‍රියා කොට තිබේ. දේශපාලනික සබඳතාව පවත්වන ලද්දේ රටේ ප්‍රධානින් සමගය. පොදු අවකාශය තුළ උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සැලකීමේ දී සිංහල බෞද්ධ අනන්‍යතාව තහවුරු කිරීම කෙරෙහි පමණක් අවධානය යොමුකොට ඇති ආකාරය පැහැදිලි වේ. ඒ බැව් මෙම පරිච්ඡේදයේ සාකච්ඡාවට ලක්කරන බෞද්ධ පුනර්ජීවනය ඇතිකිරීම, සමාජ සංවර්ධනය, රාජ්‍ය පරිපාලනය සිංහලකරණය කිරීම සහ ගොවිජනපද නගාසිටුවීම යන මාතෘකා ඔස්සේ මනාව තේරුම්ගත හැකිය. එහෙත් අනෙක් අතට පුද්ගලික අවකාශ ක්‍රියාවලිය තුළ උන්වහන්සේ සිංහල, දෙමළ සහ මුස්ලිම් යන සියලු වාර්ගිකයින්ගේ ගෞරවාදරයටපත් භික්ෂුවක් වන්නේය. මෙම උභය ක්‍රියාකාරී තත්වයන් පිළිබඳව මෙහිදී ගැඹුරින් සාකච්ඡාවට ලක්කර තිබේ.

**බෞද්ධ පුනර්ජීවනය ඇතිකිරීම**

1921 වර්ෂය වන විට සේරුවිල ප්‍රදේශය සම්පූර්ණයෙන්ම මුස්ලිම් සහ දෙමළ ජනවාර්ගික ප්‍රදේශයක් විය. වත්මන් විහාරාධිපති වහන්සේ ප්‍රකාශ කරන ආකාරයට එකල මර්සියන් අප්පු නම් එක් සිංහල පුද්ගලයෙක් පමණක් වාසයකර තිබේ. සුමේධංකර හිමි තත් ප්‍රදේශයෙහි වාසය කළ අන්‍යාගමිකයන්ගේ සහයෝගය ද ලබාගෙන සේරුවිල

චෛත්‍ය ප්‍රතිසංස්කරණය කිරිමේ කටයුතු සිදු කරන ලදි. මෙලෙස ප්‍රතිසංස්කරණය කළ සේරුවිල මංගල මහ සෑය ආරක්‍ෂා කරනු වස් මෙම ප්‍රදේශයෙහි සිංහල ජනතාව පදිංචි කරවීමේ අවශ්‍යතාවය අවබෝධ කොට, ඒ සඳහා විශාල උත්සහයක් ගෙන තිබේ. එබැවින් මෙම තත්වය පිළිබඳව එවකට පැවති රජය දැනුවත් කිරීමෙන් අනතුරුව එහි ප්‍රතිඵලයක් වශයෙන් 1952-1954 වර්ෂයන් හි අල්ලේයි ගොවිජන ව්‍යාපාරය පිහිටුවාලීමට එවකට පැවති රජය විසින් පියවර ගන්නා ලදි[3]. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ ගොවිජනපදකරණ ක්‍රියාවලියේ දී භික්‍ෂුවගේ කාර්යභාරය මෙහිදී පැහැදිලි වන බැවිනි.

ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම, ලංකාණ්ඩුවේ නැගෙනහිර පළාතේ ඒජන්තවරයාගෙන් ඒ සඳහා අවසර ඉල්ලා ඇති අතර එයට 1922.10. 13 දින අවසර ලැබී තිබුණි. එහෙත් එය ප්‍රමාණවත් නොවෙතැයි කල්පනාකළ උන්වහන්සේ 1923 ජූනි 28 දින අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ද අවසර ඉල්ලා සිටින අතර, 1924 පෙබරවාරි මස 25 දින උන්වහන්සේට ඒ සඳහා අවසර පත්‍රය ලැබී ඇත.

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් අවසර ලැබීමට පළමුව චෛත්‍ය වර්ධන සමිතියක් පිහිටුවන ලදි. ඒ සඳහා රටේ පිළිගත්, උගත්, ධනවත් ප්‍රභූන්ගේ දායකත්වය ලබාගැනීමට උන්වහන්සේ කටයුතු කර තිබේ. ඒ අනුව 1923 ජූලි 27 දින ත්‍රිකුණාමලයේදී මහා සභාවක් පවත්වා සමිතියක් පිහිටුවන ලදි. එහි මුල්ම නිළධාරි මඩුල්ල ලෙස පත් වුයේ

අනුශාසක :- දඹගස්ආරේ ශ්‍රි සුමේධංකර හිමි

ආරක්‍ෂක :- වෛද්‍යාචාර්ය සී.ඒ. හේවාවිතාරණ මහතා කොළඹ

සභාපති :- ඩී.ඩී වීරසිංහ මුදලිතුමා, මහා සෙක්‍රතාරිස් කන්තෝරුව, කොළඹ

උප සභාපති :- එච්. පී. ප්‍රේරා මහතා දකුණු කළුතර. ඒ. බී. මෙතියෙස් ද සිල්වා අමරසූරිය මහතා, ත්‍රිකුණාමලේ

භාණ්ඩාගාරික :- කේ.පී. ඩබ්. සුගතදාස වෙළෙඳ මහතා, ටී.ඒ.ඩී. කාර් සමාගමේ අයිතිකාර සහ කළමණාකාර, ත්‍රිකුණාමලේ

ලේකම් :- ඩබ්.එස්.පී.එස් ද සිලිවා, ත්‍රිකුණාමලේ.

මෙවැනි උගත්, ධනවත්, ප්‍රභූ පිරිසක් සම්බන්ධ කොටගෙන ග්‍රාමීය සංවර්ධනය කිරීමට කළුකොන්දයාවේ පඤ්ඤාසේකර භික්‍ෂුව ද කටයුතුකර තිබේ (Seneviratne 1999). චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරිමට ප්‍රථමයෙන් එම ස්ථානයට යෑම සඳහා මාර්ග යක් ඉදි කොට ඇත. නැගෙනහිර උප ඒජන්තවරයාගෙන් 1924 වර්ෂයේ දී ඒ සඳහා අවසර ලැබි තිබේ. ඒ අනුව මුත්තූර් සිට සේරුවිල දක්වා මාර්ගය ඉදිකිරිමට රුපියල් 922.97ක් වියදම් වී ඇතිබව වාර්තා වේ (සරණකිත්ති හිමි 2002).

ප්‍රතිසංස්කරණ කටයුතුවලට ප්‍රථමයෙන් මහ සෙක්‍රතාරිස්ගේ අණපරිදි චෛත්‍යය සංවර්ධන සමිතිය විසින් එහි සිතියම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට යැවිය යුතු විය. ඔහුගෙන් අවසරයක් නොමැතිව කිසිදු පුරාවස්තුවක් ප්‍රතිසංස්කරණය නොකළයුතුයයි

3 මේ සම්බන්ධයෙන් මූලාශ්‍රයන් මෙම පරිච්ඡේදයේ සිව්වැනි කොටසෙහි සාකච්ඡාවට ලක්කෙරේ.

සමිතියට දන්වන ලදි (සුමේධංකර හිමි 1924). ඒ අනුව රුවන්වැලි මහාසෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු කළ යූ. එච්. තොදෝරිස් ද සිල්වා බාසුන්නැහේ විසින් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භකරන ලදි (1925 වාර්තාව, පිට 05). මෙම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී චෛත්‍යය ගර්භයේ පස් ඉවත්කිරීමට සිදුව ඇති අතර එකී කාර්යයේ බරපතලකම හේතුවෙන් කුලීකරුවන් 40-60 පමණ සංඛ්‍යාවක් දිනපතා යෙදවීමට සිදුව තිබේ (එම). වර්තමාන විහාරාධිපති වහන්සේ ප්‍රකාශකළේ මෙම කුලීකරුවන් දෙමළ හා මුස්ලිම් ජනතාව වූ බවයි. මේ සඳහා ඔවුන්ට දෛනික වැටුපක් ලබාදී තිබේ. මෙම විහාරස්ථානය ගොඩ නැගීමට අන්‍යාගමිකයින්ගේ දායකත්වය ලැබී ඇති බැව් මෙමගින් පැහැදිලි වේ.

චෛත්‍යය සංවර්ධන සමිතිය විසින් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමත් සමග ජනතාවට චෛත්‍ය වැඳපුදා ගැනීම සඳහා මෙම ස්ථානයට පැමිණෙන ලෙස විවෘත ආරාධනාවක් කරන ලදි. ඒ අනුව 1928 දී වන්දනාකරුවන් 8,000 ක් පමණ සේරුවිල චෛත්‍යය වන්දනය සඳහා පැමිණ තිබේ (සරණකිත්ති හිමි 2002). මෙසේ පැමිණෙන ජනතාවගේ පහසුව සඳහා මුත්තූර් නගරයෙහි විශ්‍රාම ශාලාවක් ඉදිකළේය. එහි සිට සැතපුම් 10ක් පයින් හෝ කරත්තවලින් ගමන්කිරීමට සිදුවී ඇත. කෙසේ නමුත් වන්දනාව සඳහා පැමිණෙන බෞද්ධ වන්දනාකරුවන්ගේ අධාර ඇතිව ඉතා ඉක්මනින් චෛත්‍යයේ කටයුතු නිමකිරීමට හැකි වී තිබේ. ඒ අනුව 1929 ඇසළ පුර පසළොස්වක වන විට සතරැස් කොටුවේ ධාතු නිධන් කිරීමේ පිංකම පැවැත්වීමටත්, 1930 දී කොත් පැළඳීමටත්, 1931 දී රාජ්‍යය අනුග්‍රහය ඇතිව උත්සවාකාරයෙන් චෛත්‍යය විවෘතකරීමටත් හැකිව තිබේ.

බුදුන් විසින් සේරුවිල ස්පර්ශ කරන ලදැයි සොළොස්මස්ථාන වන්දනා ගාථාවෙහි සඳහන්වන බව මෙම භික්‍ෂූන් වහන්සේ පෙන්වා දී තිබේ. ධාතු වංශයෙහි සේරුවිල චෛත්‍යය පුවත අවසානයේ, තිස්සමහා වෙහෙර ධාතු පිළිබඳ කතාව නිමි යනුවෙන් දක්වීම තුළින් ඒ බැව් තහවුරු වන බැව් පෙන්වා දේ. තවද 1979 වර්ෂයේ සේරුවිලින් හමු වූ ගිරි ලිපියේ දැක්වෙන පරිදි සිව්වන කසුප් රාජ සමයේදී (ක්‍රි.ව 898-914) වර්තමානයේ ව්‍යවහාර වන සේරුවිල නාමය වෙනුවට තිස්සමහා විහාරය යයි හඳුන්වා ඇති බැව් උන්වහන්සේ වැඩිදුරටත් පෙන්වා දී තිබේ[4].

මේ අයුරින් පුරාවිද්‍යාත්මක සාක්ෂිද ගෙන තාර්කිකව බෞද්ධ අනන්‍යතාවය තහවුරු කරනු වස් උත්සුක විය. මෙම පුවත පිළිබඳ ජනතාව තුළ අවබෝධයක් ඇතිකිරීම සඳහා සුමේධංකර හිමියන් විසින් 1924 වර්ෂයේ දී ධාතු වංශය සංස්කරණයකොට ප්‍රකාශයට පත්කරන ලදි. මූලාකෘතවාදී ඓතිහාසික වටිනාකමකින් යුත් මෙම පුරාවෘතය ජනතාව වෙත යොමුකිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇති ආකාරය එමගින් පැහැදිලි වේ. ඓතිහාසික සාක්ෂි ගෙනහැරපාමින් සිංහල බෞද්ධ ජනවාර්ගික අනන්‍යතාවය තහවුරු කිරීමට උත්සුක වී තිබේ. මෙවැනි ක්‍රියාකාරකම් ජනවාර්ගික සහසම්බන්දතාවන් සඳහා ඍණාත්මකව සහ ධනාත්මකව බලපාන සාධක ලෙසින් පෙන්වා දිය හැකිය.

4 සිරි සග බෝ මපු(ර්) මුකා පස්වන්නේ දුරුත්(තෙ)
දාව දසාවක් දාව.....සකරැ තිස් මහ වෙහෙරැ ........

චෛත්‍යය ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව එහි ආරක්ෂාව සඳහා බෞද්ධ පවුල් දහසක් පදිංචි කරවා ගැනීම උන්වහන්සේගේ ඉලක්කයක් වූ බැව් පෙනේ. ඒ අනුව චෛත්‍යය විවෘතයට පැමිණි රාජ්‍යය මන්ත්‍රණ සභාවේ අග්‍රාමාත්‍යය ඩී. බී ජයතිලක මැතිතුමා ද විවෘතයෙන් පසු සිය දේශනයේ දි සේරුවිල චෛත්‍යයේ ආරක්ෂාවට බෞද්ධ ගමක් ඇතිකිරීමට අවශ්‍යය යයි ප්‍රකාශ කරන ලදි (සරණකිත්ති හිමි 2002). කෙසේ වෙතත් එය ඉටු වී නොමැත. තවද ඩි. එස් සේනානායක අග්‍රාමාත්‍යයතුමාගෙන්ද බෞද්ධ ජනපදයක් පිහිටුවන ලෙස ඉල්ලා සිටියද එයද එතුමා හදිසියේ මියයාම නිසා සිදු නොවුනි යයි සඳහන් වේ. කෙසේ වෙතත් සිංහල බෞද්ධ පිරිසක් තදාශ්‍රිතව නොවීම හේතුවෙන් උන්වහන්සේ නොයෙක් දුක් ගැහැට විඳි බැව් දැනගන්නට තිබේ. ඒ බැව් උන්වහන්සේගේ මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

> "කෙසේ වෙතත් බෞද්ධ නාමයක්වත් අසන්නට නොපැවති නැගෙනහිර පළාතේ වනාන්තරය මැද අන්‍ය ලබ්දිකයන් සමග පමණක් නොව අලි කොටි වලස් ආදි චණ්ඩ මෘග ජාතින් සමගත් පොළොන් ආදි විෂ ඝෝර සර්පයින් සමගත් සටන් කරමින් මෙතරම්වත් මෙම ස්ථානය දියුණු කරන්නට ලැබිම මගේ ජීවිතයේ වාසනාවන්ත පරිච්ඡේදය හැටියට මම සලකමි" (28).

ගොවිජනපද ආරම්භ කරන 1950 දශකය වන තුරා උන්වහන්සේ විවිධාකාර දුක් කම්කටොලුවලට මුහුණ දී තිබේ. බෞද්ධ වන්දනාකරුවන්ගෙන් ලැබෙන ආධාර උපකාර මත මෙම ස්ථානය පවත්වාගෙන පැමිණ තිබේ. එහෙත් ඇතැම් වර්ෂවලදි මැලේරියා, උණ, ගං වතුර ආදි උපද්‍රවයන් හේතුවෙන් වන්දනාකරුවන්ගේ ද පැමිණිම ක්‍රමයෙන් අඩුවන්නට වූ බැවින් ආහාරයට පවා කිසිවක් නොමැතිව කල් ගෙවා තිබුණි.

> "මේ ගැන මා විඳි දුක් අපමණය. ඇතැම්විට ආහාරයක් තබා වතුර පොදක් පමණක්වත් නොලැබ මා ගත කළ දින අනන්තය. එක් විටෙක පිටපිට එකොළොස් දිනකට මගේ ආහාරය වශයෙන් වුයේ සේරුවක් පමණ හබල පෙති ටිකක් පමණකි. එබඳු වාර අනන්තය. මහ වනය මැද මගේ ආරක්ෂක හිතවත් ඥාති මිත්‍රයන් හැටියට විසුවෝ කොටි, වලස් ආදි චණ්ඩ සතුන්ය".

සිංහල ගොවිජනපද ආරම්භ කරන තුරු උන්වහන්සේ දුක් ගැහැට විඳි බැව් මෙයින් පැහැදිලි වේ. මේ අනුව උන්වහන්සේ මෙම ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනයා නගා සිටුවීම උදෙසා විශාල උත්සහයක් ගෙන තිබේ. ඉපැරණි ලාංකේය සමාජයෙහි සිංහල බෞද්ධ ප්‍රදේශයක්ව පැවති සේරුවිල ප්‍රදේශය පසුකාලීනව දෙමළකරණයකට හසු වී ඇති බව මෙම භික්ෂුව කල්පනා කළේය. මෙම තර්කය අනුමත කරමින් පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියන් ද මෑතකදී කරුණු ඉදිරිපත්කර තිබුණි (ෆොන්සේකා 2007). නමුත් සේරුවිල ප්‍රදේශයේ ජනපදකරණයෙන් පසුව ඉදිවන සිංහල ගම්මාන සිංහල - බෞද්ධ ස්වරූපයක් විද්‍යමාන වන බව දැකිය හැකිය. උදාහරණ ලෙසින් කාවන්තිස්සපුර, සුමේධංකරපුර, මහින්දපුර ආදිය ඉන් කිහිපයක් ලෙසින් දක්වාලිය හැකිය.

මෙම ප්‍රදේශයේ ආගමික වශයෙන් උන්වහන්සේ විසින් සිදුකරන ලද සේවාව ඇරඹෙනුයේ සේරුවිල විහාරය 1921 දී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමත් සමගය. ඒ අනුව එම ප්‍රදේශයේ තවත් බෞද්ධ මධ්‍යස්ථාන කිහිපයක් ආරම්භකොට තිබේ.

> "ත්‍රිකුණාමලයේ ජයසුමනාරාමයෙහි චෛත්‍යය ඇතුළු විහාරාංග රැසක් ද, මඩකලපුවේ මංගලරාමයේ දැනට නැගෙනහිර පළාතේ තිබෙන විශාලම විහාරමන්දිරය යැයි චිර ප්‍රසිද්ධ ප්‍රතිමා මන්දිරය ආදි කොට ඇති විහාරාංග ද දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් කරවුහ. අක්කරපත්තුවේ සිරි විජයාරාමය නමින් දැනට පවත්නා දැකුම්කළු විහාරස්ථාන භූමිය දොඩම්දූවේ සිරිධම්මරතන නාහිමියන්ට ලියාපදිංචි කළ ලියවිලි මඟින් පවරා දී අක්කරපත්තුව පළාතේ බෞද්ධ බලය නඟා සිටුවීමට අප නා හිමියෝ ධෛර්යය දුන්හ.[5]"

සේරුවිල ප්‍රදේශයෙන් පරිබාහිර අන්‍යාගමිකයන් වෙසෙන ප්‍රදේශ තුළ පවා බෞද්ධ අනන්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කොට ඇති බව මේ අනුව පැහැදිලි වේ. ඒ සඳහා පළමුව උන්වහන්සේ කළේ විහාරස්ථානයක් ස්ථාපිත කිරීමත් දෙවනුව එය සංරක්ෂණය කිරීමට බෞද්ධ ජනතාව පදිංචි කරවීමත්ය.

මෙහිදී උන්වහන්සේ විසින් සිදුකරන ලද සේවාවන් ඉතා සුපරීක්ෂකාරීව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ සමාජවිද්‍යාඥ හබාමාස්ගේ සමාජ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ උභය සංකල්ප තුළින් තේරුම් කරගත හැකි බවයි. එනම්

01. පුද්ගලික අවකාශය (Private Sphere)
02. පොදු අවකාශය (Public Sphere)

සමාජ සම්බන්ධතාවයේ දී පුද්ගලික අවකාශය ධනවාදය සමග නිර්මාණය වූවකි. එම අවස්ථාවන් තුළ පුද්ගලයින් සමාජ ගතවීමේ දී සාමූහික හැඟීමක් හෝ සාමූහික අනන්‍යතාවයක් පිළිබඳ විමර්ශනය නොකෙරේ. එබැවින් පුද්ගලයා සාමූහික ආගම, සංස්කෘතිය එසේත් නැතහොත් ජනවාර්ගිකත්වය ආදී පොදු ප්‍රපංචයන්ට වඩා ප්‍රාග්ධනය ප්‍රමුඛ කොට ගනියි. එහෙත් හබාමස් දක්වන ආකාරයට පොදු අවකාශය සිවිල් සමාජය (Civil society) තුළ පොදු දේපළ සම්බන්ධයෙන් ඇතිකරනු ලබන ඉඩ ප්‍රස්ථාවයි. එනම් ප්‍රජාතාන්ත්‍රික දේශපාලන රාමුව තුළ පුද්ගල අවශ්‍යතාවයන් සන්තර්පණය කරගැනීමට ඇති ස්වාධීනත්වය වේ. ප්‍රජාතාන්ත්‍රික සමාජ තත්වය උපයෝගී කරගනිමින් සමාජ සමූහයට වඩාත් වැදගත් සමාජ ව්‍යුහීය තත්වයන් (Social Structural Conditions) හඳුනා ගැනිමට උත්සුක වීම වේ (Kivisto 2004). එම විග්‍රහයට අනුව යම් ජන සමූහයක් අනන්‍යතාවය තහවුරු කරගැනීමත්, පවතින අනන්‍යතාවයන් සුරක්ෂිත කරගැනීමත් සඳහා වාස්ථවික හා ආත්මීය තත්වයන් සම්බන්ධයෙන් සමජගතවීමත් සහ ප්‍රතිචාර දැක්වීමත් යන තත්වයන් පොදු අවකාශය ඔස්සේ තේරුම්ගත හැකිය.

5 දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර නාහිමියන්ගේ ආදානෝත්සවය සඳහා 1984 අගෝස්තු මස 19 වන දින සේරුවිල පවත්වන ලද ආදාහන පූජෝත්සවයේ දී ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද පත්‍රිකාවකිනි.

පොදු අවකාශය තුළින් කරුණු විමර්ශනාත්මකව බැලීමේ දී පැහැදිලි වන්නේ, බෞද්ධ බලවේගය පුනර්ජීවනය කිරීම වස් උන්වහන්සේ විසින් ඓතිහසික සාධක පවා ගෙනහැර දක්වා ඇති බවයි. උදාහරණයක් වශයෙන්, උන්වහන්සේ විසින් රජයට ඉදිරිපත්කරන ලද යෝජනාවලියක අංක නම වැන්න සහ දස වැන්න පෙන්වා දිය හැකිය. එය සිංහල බෞද්ධ ජනතාව උදෙසා වඩාත් වැදගත් සමාජ ව්‍යූහීය තත්වයක් නිර්මාණය කරගැනීමට සහ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට ගත් ප්‍රයත්නයක් බැව් පැහැදිලි කරුණකි.

> 09. ඉතිහාසයේ දැක්වෙන පරිදි සේරුවිල විහාරස්ථානයට කාවන්තිස්ස රජතුමා විසින් පුදන ලද යොදුන් තුනක් පමණ වූ ගොඩ මඩ ඉඩම් නිරවුල් කොට ගෙන එහි බෞද්ධ ගමක් ඇතිකිරීම.
>
> 10. සේරුවිල විහාරය අවට බෞද්ධ පවුල් දහසක් පදිංචි කරවීම.

මෙම ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි වන කරුණක් නම් පොදු අවකාශය තුළ දී අන්‍ය වාර්ගික සමූහ අපහරණයට (Discrimination) ලක්වී ඇති බවයි. ඉහත ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී මුස්ලිම් හා දෙමළ ජනතාව එම ප්‍රදේශයන්ගෙන් ඉවත්කිරීමට ද සිදුව ඇත. සිංහල බෞද්ධ බලවේගය වැඩිකරනවාත් සමගම, සිංහල බෞද්ධ පාරිශුද්ධ ප්‍රදේශයන් නිර්මාණය කිරීමට උත්සුක වූ ස්වරූපයක් දැකිය හැකිය. මෙවැනි සංසිද්ධීන් වාර්ගික සමාජයක සමාජීය සම්බන්ධතා බිඳවැටීම කෙරෙහි සෘජුවම බලපානු ලබයි. තෝප්පූර් ප්‍රදේශයේ අදටත් වාසය කරන්නේ මුස්ලිම් ජනතාවයි. උන්වහන්සේ ප්‍රකාශ කළ පරිදි තෝප්පූර් යන්නෙන් අර්ථවත් වනුයේ ථූපයට අයිති ගම යන්නයි. එහෙත් සිංහල ගොවිජනපද ඇතිවීමත්, බෞද්ධ ජනතාව පන්සල අවට පදිංචි කරවීමත් යන කරුණු හේතුවෙන් මුස්ලිම් හා දෙමළ ජනතාව පන්සල් අවට භූමි ප්‍රදේශයන්ගෙන් ඉවත් වී ඇති බැව් පැවසේ. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු වාර්තා නොවේ.

මෙම භික්ෂුව සිංහල බෞද්ධ පුනර්ජීවනය ඇතිකිරීමේ කාර්යයේ දී මූලාකෘත එළඹුම්වාදීන් විග්‍රහකර දක්වන ආකාරයට අනන්‍යතාවය තහවුරු කරගැනිමට ගත් උත්සහය පැහැදිලිකොට ගත හැකිය. එහි දී පැරණි ශිලා ලේඛන මෙන්ම වංශකථාවන්හි සඳහන්වන බෞද්ධ උරුමයන් තහවුරු කරගැනිම තුළින් ද ඒ බැව් මනාව පැහැදිලි වේ.

> **"අසිංහලයින්ට යට වී ඇති සිංහල ගමක් බේරා දෙන්න"**
> **1969 ජුනි 20 "දවස"**
>
> ඓතිහාසික නටබුන් සහ මඟුල් මහ වෙහෙරත් අරුගම්බෙහි පිහිටි මුහුදු මහා වෙහෙර පිහිටා ඇති පුරාණ සිංහල ගම්මානය අසිංහලයන්ගෙන් නිදහස් කොට එහි සිංහල බෞද්ධයින් පදිංචි කරවා ඓතිහාසික විහාරස්ථානයේ ආරක්‍ෂාව සලසා දෙන සේ සේරුවිල රජමහා විහාරාධිපති දඹගස් ආරේ ශ්‍රී සුමේධංකර නායක හිමියෝ අගමැති ඩඩ්ලි සේනානායක මහතාට සංදේශයක් යවමින් ඉල්ලා සිටිති.

කැළණිතිස්ස රජුගේ රාජධානියක් වශයෙන් තිබී පසුව නටබුන් බවට පත් පොතුවිල අරුගම්බේ මුහුදේ මහ වෙහෙර ...

විවිධ හේතු පදනම් කොටගෙන රාජධානි විවිධ ස්ථානයන්හි පිහිටුවනු ලැබීය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ පරදේශ ආක්‍රමණයන් හා ස්වභාවික උවදුරුය. සේරුවිල මෙන්ම උතුරු නැගෙනහිර පළාත්හි බොහෝ ප්‍රදේශයන්හි සිංහල බෞද්ධයන් වෙනත් ස්ථාන කරා සංක්‍රමණය වීමත් සමඟ අන්‍යාගමිකයන් එහි පදිංචි වී ඇත. උන්වහන්සේ සේරුවිල ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව අනෙක් ප්‍රදේශ ද සිංහල බෞද්ධයන් සඳහා තහවුරුකර දීමට කටයුතුකර තිබේ.

එපමණක් නොව උන්වහන්සේ බෞද්ධ බලය තහවුරු කිරීම සඳහා කවර පිවයර ගත්තේද යන්න පහත සඳහන් ලිපි මගින් මනාව පැහැදිලි වෙයි.

**බොදු අයිතියේ සටන ත්‍රී'මලයෙන් ඇරඹේලු**
**(1969 නොවැම්බර් 4 ලංකාදීප)**

බෞද්ධ අයිතිවාසිකම් වැලලී යනු දැක ඒවා ආරක්ෂා කර ගැනීමට සිංහල බෞද්ධයන් ආගමාලයෙන් යුතුව අරඹන සාධාරණ සටන යම් දිනෙක ත්‍රී'මලයෙන් ආරම්භ වනවාට කිසිඳු සැකයක් නැතැයි ත්‍රි'මලයේ ජයසුමනාරාම විහාරස්ථානය අසල පල්ලියක් ගොඩ නැන්වීම ගැන විරුද්ධත්වය පළකරමින් සේරුවිල නාහිමියෝ ත්‍රි'මල දිසාපතිවරයාට ලිපියක් යවමින් කියා සිටිති.

**"කෝනේශ්වරම්" තහනම්**
**(1969.12.30 සිරිලක)**

ත්‍රිකුණාමලයේ ෆෙඩ්‍රික් කොටුව තුළ ඇති කෝනේශ්වරම් දේවාලය පිහිටි භූමිය ද්‍රවිඩයන් සතු ස්ථානයක් නොව ඓතිහාසික ගොකණ්ණ විහාරය පිහිටා තිබූ බෞද්ධයන් සතු පූජනීය ස්ථානයක් යැයි කියමින් කාලයක් සටන් කළ සමස්ථ ලංකා බෞද්ධ සම්මේලනය ත්‍රි'මලයේ පැවැති සිය 51වැනි සම්මේලනයේ දී ඒ සම්බන්ධව වචනයක් පවා කතා කිරීම සාමාජිකයන්ට සම්පූර්ණයෙන්ම තහනම් කර තිබුණි.

සේරුවිල රජමහා විහාරාධිපති දඹගස්ආරේ සුමේධංකර නායක හිමියෝ බෞද්ධ සම්මේළනය අමතා කතා කරමින් කොනේශ්වරම් ප්‍රශ්නය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට උත්සාහ කළ අවස්ථාවේ එම කතාව අතරමග නතර කර දැමූ බෞද්ධ සම්මේලනයේ අභිනව සභාපති මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා කෝනේශ්වරම් ගැන වචනයක්වත් පාවිච්චි නොකරන ලෙස සම්මේලනයට සහභාගී වූවන්ට නියෝග කර තිබේ.

උන්වහන්සේ පමණක් නොව සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයද සම්බන්ධකොටගෙන නැගෙනහිර ප්‍රදේශයේ බෞද්ධ බලය තහවුරු කිරීමට ක්‍රියාකොට තිබේ. එක් පැත්තකින් පැරණි බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවනවා මෙන්ම අනෙක් අතින් වෙනත් ආගමික් සිද්ධස්ථාන ඉදිකිරිමට විරුද්ධ වීමෙනුත් සහ වත්මන් කෝනේශ්වරම් දේවස්ථානයේ මූලාරම්භක අයිතිය කියාපාමින් එය ඉවත් කිරිමට පියවර ගැනීමට උත්සුක වීමත් ආදී කටයුතු තුළින් පැහැදිලි වන්නේ සිංහල බෞද්ධ පාරිශුද්ධත්ව ඇතිකිරීම සඳහා මෙම භික්ෂුව ගෙන ඇති උත්සහය වේ. ජනමාධ්‍ය ද වාර්ගික අනන්‍යතාවය වෙනුවෙනු ක්‍රියාත්මක වී තිබේ. ආගමික සහ වාර්ගික අනන්‍යතාවය තහවුරු කරගැනීමට පොදු අවකාශය තුළ තරගකාරිත්වයක් නිර්මාණය වී තිබේ. මෙම පොදු අවකාශ මතවාදයන් වාර්ගික සම්බන්ධතා කෙරෙහි බලපා ඇති බව පැහැදිලිය. මෙම ක්‍රියාකාරිත්වය තුළින් නැගෙනහිර ප්‍රදේශයේ ජනවාර්ගිකත්වය මත පදනම් වූ ආගමික තරගකාරිත්වයක් ගොඩනැගී තිබේ. ඒ බැව් පැහැදිලි වන්නේ දමිල හින්දූන් නියෝජනය කරන **අපි දෙමළු** නම් සංවිධානයක් බිහිවීමත් ඔවුන් විසින් බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීමටත්, බලහත්කාරයෙන් ඉඩම් අල්වා ගැනීමටත් ක්‍රියාකර ඇති බැවිනි. එම සංවිධානය ප්‍රබලාකාරයෙන් ක්‍රියාත්මක වූ බව ක්ෂේත්‍ර තොරතුරු මඟින් ද තහවුරු විය.

> **බුදුපිළිම කඩා දමති**
> **(මුල්පිටුව) රිවිදින : 1963 සැප්තැම්බර් 15**
> **මාණ්ඩලික ලේඛක - රෝහණ ගමගේ**
>
> සේරුවිල පූජා භූමියට ආසන්න ප්‍රදේශවල තිබෙන පැරණි බුදු පිළිම කඩා බිඳ දැමීම සහ එම පළාතේ බෞද්ධ ජනතාවගෙන් අගමැතිනියටත්, සංස්කෘතික පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවලටත් පැමිණිලි ඉදිරිපත් වී ඇත.
>
> කල්ලරායි ගොවිජනපද අසල බුදු පිළිම කිහිපයක අතපය කඩා අඩි 15ක් පමණ ගැඹුරු වලවල්වල ඔබා තිබුණු අයුරුද සමහර බුදුපිළිම තිබූ ස්ථානවල දේවරූප සවිකර තිබූ අයුරුද සියැසින් දුටුවේ යැයි සේරුවිල මංගල රජමහා විහාරාධිපති දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර නාහිමියෝ කීහ.

මෙම තරඟකාරිත්වය කොතෙක් තීව්‍ර වී ඇත්දැයි කිවහොත් සේරුනුවර නගරයට කි.මි එකක් පමණ දුරින් පැවති විශාල බෝධි රුක්ෂයක් එක් රැයකින් කපා ඉවත්කොට එම ස්ථානයේ දේවාලයක් ගොඩනගා තිබේ. සමාජයේ ආගමික ප්‍රපංචය හරහා අනන්‍යතාව තහවුරු කිරීමට සිංහල බෞද්ධ ජනතාව සහ දෙමළ හිංදු ජනතාව ක්‍රියා කොට තිබේ. මෙම ප්‍රති විරෝධතාව සාමාන්‍ය ජනතාව තුළින් තේරුම්ගත නොහැක. එහෙත් දේශපාලනික වශයෙන් මෙය ගොවිජනපද ආරම්භයේ සිටම (1952) ඇති වු ක්‍රියාවලියක් බැව් ඓතිහාසික විකාසනවාදි එළඹුම ඔස්සේ කරුණු විශ්ලේෂණය කර බැලිමේදි පැහැදිලි වේ. දෙමළ දේශපාලනික බලවේග සිය අනන්‍යතාව ප්‍රදේශයේ තහවුරු කිරීමට උත්සහ ගනිද්දී, සිංහල බෞද්ධ දේශපාලනික පර්යාය තුළ සිංහල බෞද්ධ අනන්‍යතාව තහවුරු කිරීමට වෙර දැරූ ස්වරූපය විද්‍යමාන වේ. ෆෙඩ්රික් බාර්ත් (1969) පවසන ආකාරයට ජනවාර්ගික කණ්ඩායම් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් පවතින අවස්ථාවලදි ඔවුන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය තුළ පහත සඳහන් ගැටලු ඇතිවිය හැකිය. එනම්,

01. ස්වාභාවික පරිසරයේ පදිංචිය අනුව සම්පත් සඳහා පවතින තරගය හා වාණිජමය හෝ වෙනත් ගැටලු.

02. ස්වකීය දේශසීමා සඳහා ඒකාධිකාරියක් ඇති විට සම්පත් සඳහා තරගකාරී රටාවක් ඇති වීම.

03. වැදගත් භාණ්ඩ හා සේවා පිළිබඳ මතුවන ගැටලු.

යනාදි වශයෙනි. මෙමගින් පැහැදිලි වන්නේ සිංහල බෞද්ධ සහ දෙමළ හිංදු ජනවාර්ගික සමූහ අතර පූර්වෝක්ත ගැටලුකාරී තත්වයන් නිර්මාණය වී ඇති බවයි. මේ තත්වය සුමේධංකර හිමියන්ගේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමෙන් තවදුරටත් පැහැදිලි කර ගත හැකිය. මෙම භික්ෂුව බෞද්ධ පුණර්ජීවනය ඇතිකිරීමේ කාර්යයෙහි සිදුකළ තවත් ප්‍රධාන කර්තව්‍යයක් ලෙසින් ධර්ම ප්‍රචාරණය පෙන්වා දිය හැකිය. දමිළ ජනතාවට ද දෙමළ බසින් ධර්මය දේශනාකොට තිබේ. මෙමගින් පුද්ගලික අවකාශය තුළ ජනවාර්ගික සම්බන්ධතා වර්ධනය කිරීමට හේතු වී තිබේ.

ධර්ම ප්‍රචාරණය විවිධාකාරයෙන් සිදුකොට තිබේ. සාමාන්‍ය ධර්ම දේශන සඳහා සහභාගීවීම, සිර මැදිරිවල ධර්ම දේශනය (ඒ සඳහා රජය විසින් උන්වහන්සේ පත්කොට තිබේ), ධර්ම සාකච්ඡා සඳහා සහභාගීවීම, සහ පුවත්පත් මගින් ධර්ම ප්‍රචාරණය (ලිපි විශාල සංඛ්‍යාවක් තිබේ) ආදි වශයෙන් භික්ෂුවක් ලෙස මෙහෙයක් සිදුකොට ඇති බව පෙන්වා දිය හැකිය. සිංහල බෞද්ධ පුනර්ජීවනය පැතිරවීම නැගෙනහිරට පමණක් සීමා කොට නැති බැව් පහත ලිපියෙන් පැහැදිලි වෙයි.

> ගරු ලංකා අග්‍රාමාත්‍යතුමා වෙතටයි.
> කොළඹ
> ප්‍රිය ගරු අගමැතිතුමනි,
>
> <u>ලංකාව සිංහලයින්ගේ ද්වීපයක් බවට පත් කිරීම</u>
>
> ඉහත සඳහන් කාරණය ගැන වචන කීපයක් සිංහලයකු වශයෙන් ද, බෞද්ධයෙකු වශයෙන් ද වර්තමාන ලෝකයෙහි සිංහලයින් වී ඉපදී ජීවත් වී අවසානය නොහොත් මරණය දක්වාම සිටීමට ඇති මෙම කුඩා දිවයින සිංහලයින්ගේ ද්වීපයක් කළ හැකි මාර්ග කිහිපයක්ම මෙහි පහත ඇත. මෙවැනි ක්‍රියාමාර්ග යක් අප රටට නිදහස ලැබුණු අවධියේ දීම නිදහස ලැබූ බුරුමය විසින් ද කර ඇත. බුරුමය බෞද්ධ රටකි.
>
> 1) සිංහල රටට යුරෝපීයන් නිසා පැමිණ රක්ෂාවල් ලබාගෙන සිංහලයින්ව පාගාගෙන දියුණු වී එදා මෙරට අල්ලා ගත් බ්‍රිතාන්‍යයන් විසින් මුඩුබිම් පනත ඇතිකරගෙන, රජය කොල්ලකාගෙන එයින් පසුව සිලිමට දෙකට බ්‍රිතාන්‍ය සමාගම්වලට විකුණා වගාකර එහි සාරය ගෙන ඊට පසුව වතු වල සේවය කළ ද්‍රවිඩයින්ටම විකුණා ඇති සියළුම ඉඩම් රජයට ගැනීම.
>
> 2) බ්‍රිතාන්‍යයින් වැවිලි සඳහා ගෙන්වාගත් ඉන්දීය ද්‍රවිඩයින්ගෙන් පැවත එන මෙහි ස්වදේශිකයින්ගෙන් තුට්ටුවට දෙකට මිලදී ගත් ඉඩම් සියල්ලම රජයට ගැනීම.

3) ලාංකිකයින් නොවන සෑම දෙනෙකුන්ගේම අතේ පවතින වෙළඳාම රජයට පවරා ගැනීම නැතහොත් සමූපාකාර තොග වෙළෙඳ ආයතනයට පැවරීම.

4) පළාත් පාලන ආයතනවල සහ පෞද්ගලික ආයතනවල සේවය කරන ලාංකික නොවන සියළුම සේවකයින් අස් කරවීමට නියෝග කිරීම.

5) කොළඹ ආදී නගරවල තිබෙන විදේශකයින් සතු සියළුම ගොඩනැගිලි රජයට ගැනීම හෝ ජනසතු කිරීම.

6) විදේශිකයින් සතු වෙනත් ව්‍යාපාර සහ සිංහලයින් සමඟ ගිවිසුම් බැඳගෙන පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇති සියලුම ව්‍යාපාර ජනසතු කිරීම

මෙම ක්‍රමයන් ක්‍රියාවට පරිවර්තනය කරන තුරු අපේ රටේ සිංහලයාට සැනසීමක් නොලැබේ. බෞද්ධයා - බෞද්ධ නාමය ඇතිව මිය යාමට නොලැබේ. එසේම මෙම කරුණු හය අද පවතින නිසා අපේම සිංහලයා භේදභින්න වී ඇත.

කරුණාකර මේ ගැන ගත යුතු ක්‍රියාමාර්ගය ගැනීමට වහාම නීති සම්පාදනය කරන මෙන් ඉල්ලමි.

ඒ වගත් මෙසේ දන්වා සිටින්නේ
සේරුවිල නායක මහා ස්ථවීර
**"බෞද්ධ බලය" ජනවාරි කලාපය 1964 ජනවාරි (බු. ව. 2507)**

උන්වහන්සේගේ ක්‍රියා කලාපය සේරුවිලට හෝ ත්‍රිකුණාමලයට නැතහොත් නැගෙනහිර පළාතට සීමා නොකළහ. සිංහල බෞද්ධ රාජ්‍යයක් ප්‍රවර්ධනය කිරීමට උන්වහන්සේගේ ආකල්පයක් පැවති බැව් මින් පැහැදිලිය. ඕනෑම වාර්ගිකත්වයක එක් ස්වරූපය වන්නේ අන්‍ය වාර්ගිකයින්ට විරුද්ධ වීමය. මේ ස්වභාවය උන්වහන්සේගේ ක්‍රියා කලාපය පරීක්ෂා කිරිම තුළින් අපට තේරුම්ගත හැකිය.

වාර්ගික සම්බන්ධතාවය, පොදු අවකාශය තුළ ඔවුනොවුන් සුහදශීලී වූ, අනුකලනය වූ, වාර්ගික සමූහයන් ලෙස හඳුනා ගැනීම උගහටය. ඒ මන්ද යත් ඔවුන් අතර මතවාදී දේශපාලන ගැටුම් සමාජ විකාශන ක්‍රියාවලිය තුළින් පැහැදිලි වන හෙයිනි. සිංහල ජනතාව සිංහල - බෞද්ධ පුනර්ජීවනයක් ඇති කිරීමට උත්සහ දරන විට දෙමළ ජනතාව දෙමළ - හින්දු පුනර්ජීවනයක් ඇති කිරීමට ක්‍රියාකර ඇති බැව් පැහැදිලි වේ.

> "එපමණක් නොව අදත් අසල් වැසියන් හින්දු සහ මුස්ලිම් භක්තිකයන් බැවින් චෛත්‍ය ප්‍රතිසංස්කරණයට යෝග්‍ය පිරිසක් අසල පදිංචි නොවුවහොත් නැවත ද මදකලකින් පෙර පැවති තත්වයට මෙම ස්ථානය පත්වනු ඇත. මේ බව සලකා සේරුවිල අවට **බෞද්ධ පවුල් දහසක්** පමණ යුත් සිංහල ජනපදයක් ඇති කරන ලෙස සුමේධංකර හිමියන් අගමැතිගෙන් ඉල්ලීමක් කර ඇත (දවස 1956 ඔක් 27)"

මෙමගින් පැහැදිලි වන්නේ මෙම භික්ෂූන් වහන්සේ සිංහල බෞද්ධ ගොවිජනපද ඇතිකිරීම කෙරෙහි දක් වූ උත්සහය වේ. අනන්‍යතාවය පිළිබඳව අවධානය යොමුකිරීමේ දී සිංහල බෞද්ධ යනු එකම අනන්‍යතාවයෙහි පැතිකඩ දෙකක් වේ. මෙහිදී ප්‍රබල කාරකය වන්නේ සිංහලද, නැතහොත් බෞද්ධ ද යන්න ගැටලුකාරී තත්වයකි. මෙම භික්ෂුව ඉහත ලිපියෙහි සදහන් කරන්නේ, **"බෞද්ධ පවුල් දහසක් පමණ යුත් සිංහල ජනපදයක්"** යනුවෙනි. මෙහි මූලිකත්වය දී ඇත්තේ බෞද්ධ ආගමට වේ. සිංහල බෞද්ධ අනන්‍යතාවය සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය ගණනාථ ඔබේසේකර (2004) පවසන්නේ,

> "සිංහලවීම යනු බෞද්ධවීමය. ඒ එකම අනන්‍යතාවයෙහි පැතිකඩ දෙකකි. එහෙත් බෞද්ධවීම යනු සිංහලවීම නොවේ. මේ ග්‍රන්ථ ලියූ භික්ෂූන් ද දනසිටි පරිදි සිංහලයන් නොවූ බෞද්ධයෝද සිටියහ. මෙහිදී ප්‍රශ්නය වන්නේ අනන්‍යතාවයෙහි කුමන අංශය වඩා බලවත් වන්නේ ද යන්නයි. මහාවංශයත්, නියත වශයෙන්ම පූජාවලියත් පවසන්නේ වඩා බලවත් බෞද්ධ අංශය බවයි"

ඓතිහාසික වශයෙන් ද අනන්‍යතාවය තහවුරු කිරීමේ බෞද්ධ අංශය මූලිකව පැවතියා මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ජනවාර්ගික අනන්‍යතාව තහවුරු කිරීමේ ක්‍රියාවලිය තුළද බෞද්ධ අංශය ප්‍රධාන ප්‍රපංචය ලෙසින් භාවිතයට ගෙන තිබේ.

සේරුවිල නාහිමියන් පැහැදිලි කරන්නේ සේරුවිල පවතින ද්‍රවිඩ නාමකරණය ඉපැරැණි ශ්‍රී ලංකාවේ පැවති සිංහල-බෞද්ධ නාමකරණයන් හි පරිවර්තනයක් බවයි (ජනසතිය 1966 ජූලි 16). කාවන්තිස්ස රජු දවස ඉදි කරන ලද ග්‍රාමයන්හි ග්‍රාම නාම සිංහල බෞද්ධ විය. එහෙත් මෙම ප්‍රදේශයෙන් සිංහල බෞද්ධයින් ඉවත් වූ විට එම ග්‍රාම නාම දමිළ සහ මුස්ලිම් ජනතාව විසින් දෙමළ බසින් භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් වර්තමානයේ මෙම ද්‍රවිඩ නම් දැකිය හැකි.

| **ඓතිහාසික සිංහල නාමය** | **වර්තමාන භාවිත ද්‍රවිඩ නාම** |
|---|---|
| ස්වූපපුරය | තෝපූර් |
| කිරිපට්ටිය | කිලිවෙට්ටිය |
| කෝටියක් ආරාම ඇති ප්‍රදේශය | කොට්ටියාරම් |
| මලියදූව | මලියතිව් |
| ලංකා පටුන | ඉලංගතුරේ |
| ගිරිහඩුසෑය | තිරියාය |

යනුවෙන් වෙනස් වී ඇති බව පැහැදිලිය.

කෙසේ වුවත් 1921 දි මෙම ප්‍රදේශයට සුමේධංකර හිමියන් පැමිණෙන විටත් මුස්ලිම් ජනතාව මෙහි ජීවත් වු අතර අදත් එහි ජීවත් වන බහුතර ජනතාව මුස්ලිම් වේ. කිලිවෙට්ටිය සේරුනුවර නගරයේ සිට කි.මී 01 ක් පමණ දුරින් පිහිටි ගමකි. කොට්ටියාරම් යනු කෝටියක් ආරාම තිබූ ප්‍රදේශය ලෙසින් අර්ථ ගන්වන බව දැක්වේ. ඉලංගතුරේ නොහොත් ලංකාපටුන වර්තමානයේ ද ආගමික ස්ථානයක් වශයෙන් දැඩි තරගකාරීත්වයකට නතු වූ ප්‍රදේශයකි.

යථෝක්ත කරුණු පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ මූලාකෘත එළඹුම්වාදීන් (Primodialists) පෙන්වාදෙන ආකාරයට යම් ජනවාර්ගික සමූහයකගේ අනන්‍යතාවය (Identity) ගොඩ නැගෙනුයේ ඓතිහාසික මූලයන් පදනම් කරගෙන බවය. ඒ අයුරින් ජනවාර්ගික අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා උන්වහන්සේ ඓතිහාසික උරුමයන් විමර්ශනය කරමින් එහි අයිතිය තහවුරු කරගැනීම සිදුකොට තිබේ. වර්තමානය වන විට සේරුවිල ප්‍රදේශය සිංහල බෞද්ධ බලය ජනතාව ජීවත් වන බව තහවුරු වූ ප්‍රදේශයක් බවට පත්ව තිබෙන්නේ උන්වහන්සේගේ මෙම මූලාකෘත අනන්‍යතාවය විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. මෙම සේරුවිල ඓෛතිහාසික වෙහෙර සම්බන්ධයෙන් ධාතු වංශයේ දිගු විස්තරයක් ඇති අතර ආචාර්ය චාල්ස් ගොඩකුඹුරයන් පවසන ආකාරයට සාපේක්ෂව ලංකාවේ ඉතිහාසය පිළිබඳ ලියැවෙන කෘති අතර වඩාත් පිළිගත හැකි සාධක සහිත කෘතියක් සේ එය සැලකේ. මෙම ඓතිහාසික පුරාවෘතය සේරුවිලින් හමුවන ගිරි ලිපියෙන්ද පුරාවිද්‍යාඥයින් තහවුරුකර තිබේ. අනන්‍යතාවය තහවුරු කිරීමට පුරාවිද්‍යාත්මක සාක්ෂි ගවේෂණය කිරීම කෙරෙහිද යොමුව තිබේ. යම්කිසි බෞද්ධ අනන්‍යතාවක් වෙනුවෙන් පුරාවිද්‍යාත්මක සාක්ෂියක් ලද පමණින් එය ජනමාධ්‍ය හරහා ප්‍රචාරණය කරමින් සිංහල බෞද්ධ ජනවාර්ගික උද්දීපනයට කටයුතු කොට තිබේ.

සුමේධංකර නාහිමියන්ගේ ආගමික හා සමාජීය මෙහෙවර කෙසේ ද යන්න ශ්‍රී ලංකවේ පළමු ජනාධිපති විලියම් ගොපල්ලව මහතා එක් අවස්ථාවක කරන ලද ප්‍රශංසාවෙන් මනාව පැහැදිලි වේ. එතුමා සේරුවිල විහාර භූමියේ නව විහාර මන්දිරයක් උදෙසා මුල් ගල් තැබීමේ උත්සවයකට සහභාගී වෙමින් මේ බව ප්‍රකාශ කර තිබේ.

> **ජාතියේ ශාසනයේ උරුමයන් රැකුණේ වීර පුතුන් නිසයි.**
> **ජනපති (දිනමිණ 1973. 08. 16)**
>
> නිදහස් ස්වෛරී ස්වාධීන ජාතියක් වශයෙන් අපේ ශ්‍රමය රට වෙනුවෙන් කැපකිරීම ජාතියට කළ හැකි උසස්ම සේවයයි. අදට වඩා බොහෝ කරදර ඇති වූ කාලවල දී ජාතිය හා ශාසනය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ වීර පුතුන් ලක්දිව නොසිටින්නට අද සිංහල ජාතියේ හා බුද්ධ ශාසනයේ උරුමයන් අපට අහිමි වන්නට තිබුණි යැයි සේරුවිල රජමහා විහාරස්ථානයේ නව විහාර මාළිගයට මුල්ගල් තැබීමේ උත්සවයේ දී ශ්‍රී ලංකා ජනාධිපති විලියම් ගොපල්ලව මහතා ප්‍රකාශ කළේය

උන්වහන්සේගේ ශාසනික සේවාවට රාජ්‍ය අනුග්‍රහය ද නොමදව ලැබී තිබිණි. මෙමගින් ආගම සහ දේශපාලන ක්‍රියාකාරිත්වය අතර එකඟත්වයක් විද්‍යමාන වේ. මෙම තත්වය ප්‍රදේශයේ වෙනත් ජනවාර්ගික පරිපාලකයින් (විශේෂයෙන් දෙමළ හිංදු) අතර ප්‍රදේශයේ උරුමය, වාර්ගික අනන්‍යතාවය තහවුරු කිරීමට ගත් උත්සහයන් නිසා තරග කාරී ස්වභාවයන් ගැටුම් දක්වා වර්ධනය වී තිබුණි. ආගමික පුනර්ජීවනය ඇතිකිරීමේ කාර්ය්‍යයේ දී යහපත් සමාජයක් ගැන කල්පනා කිරීමේ දී සිංහල බෞද්ධයින් ගැන පමණක් කල්පනා නොකළේය. ඒ බැව් තහවුරු වන්නේ උන්වහන්සේ දෙමළ ජනතාවට ද ධර්මය දේශනාකිරීම තුළිනි. එහෙත් දෙමළ ජනතාව බුද්ධාගමට ගැනීමට බඳවා ගැනීමට ගත් තැනක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සොයාගත නොහැකිය.

**සාරාංශය**

ඉහත සඳහන් කළ පරිදි අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර වැන්නවුන් ලංකාවේ බහුත්ව ආගමික දර්ශන තුළින් බෞද්ධාගම වෙන්කරවා ගැනීමට උත්සුක විය. මෙම භික්ෂුවගේ ක්‍රියාකාරිත්වය විමසුමෙන් පැහැදිලි වන්නේ ප්‍රාදේශීය වශයෙන් ප්‍රායෝගිකව බෞද්ධාගම අන්‍යාගමිකයින්ගෙන් වෙන්කිරීම සහ බෞද්ධ අනන්‍යතාවය තහවුරු කිරීමට ක්‍රියාකොට ඇති බවයි. විශේෂයෙන් පූර්වකාලය තුළ සිංහල සහ දෙමළ ජනවාර්ගික සමූහයන් අතර පැහැදිලි ජනවාර්ගික සීමාවන් නොතිබුණි. ආගමික හා සංස්කෘතික වශයෙන් ඔවුහු අනුයෝජනය වී සිටියහ. එහෙත් මෙම භික්ෂූන් වහන්සේ විසින් එමඟින් සංකේතාත්මකව සිංහල බෞද්ධ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් එම තත්වය වියෝජනය (separation) කිරීමට කටයුතු කරන ලදි.

## පරිශීලිත ග්‍රන්ථ

අමරදාස, ලියනගමගේ සහ ගුණවර්ධන ලෙස්ලි, (1961). **අනුරාධපුර යුගය**, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැළණිය.

ඒකනායක, ඊ. එම්. එන්, පුගේන්ද්‍රන් ආදීන් (2000). **සිවිල් පරිපාලනය 200 වන සංවත්සරය,** දිසාපති කාර්යාලය, ත්‍රිකුණාමලය.

ඔබේසේකර, ගණනාථ (2003). **බුදුසමය, ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාවථ බෞද්ධ ගැටලු,** (සංස්. දීගල්ලේ මහින්ද) නොර්වේ බෞද්ධ සංගමය,

---එම--- (2004). බුදුසමය, ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාව: බෞද්ධ ගැටලුවක් (පරි. කේ. එන්. ඕ ධර්මදාස) **ඉදුවර පර්යේෂණාත්මක ලේඛණ සංග්‍රහය**, ආරිය ප්‍රකාශකයෝ.

කොඩ්රින්ටන්, එච්. ඩබ්. ( 1939). **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**, ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ගම්ලත්, සුචරිත (1994). **ථූපවංශය,** ඇස්. ගොඩගේ සහ සහෝදරයො, කොළඹ.

ගුණවර්ධන, ලෙස්ලි (1979). සිංහල ජනයා "ඉතිහාසයෙහි සහ ඉතිහාසකරණයෙහි සිංහල හැඟීම. **ලංකාවේ ජාතිකත්ව ගැටළුව හා සමාජ විපර්යාශය,** සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ.

ධම්මරතන හිමි, හිස්සැල්ලේ (2000). **සිංහලයේ ද්‍රවිඩ බලපෑම**, මානවහිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.

ධර්මදාස, කේ. එන්. ඕ. සහ තුන්දෙනිය, එච්. එම්. එස් (1994). **සිංහල දේවපුරාණය**, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,

බණ්ඩාර, නවරත්න (1999). **ජාතික අනුකලනය යනු කුමක්ද?** පුහුණු කිරීමේ මොඩියුලය, ජාතික ඒකාබද්ධතා වැඩසටහන් ඒකකය සඳහා පිළියල කළ මොඩියුලය.

සරණකිත්ති හිමි, සේරුවිල සහ අමරකිත්ති හිමි, කොටපොල (2002). **පූජණීය සේරුවිල,** මංගල මහා චෛත්‍ය වර්ධන සමිතිය, සේරුවිල.

සිරිවර්ධන සුසිල්, (1979). ලංකාවේ එත්නික් විඥානය කෙරෙහි බ්‍රිතාන්‍යය ව්‍යවස්ථාදායක ප්‍රතිපත්තිය බලපෑ ආකාරය පිළිබඳව කෙටි සටහනක්. **ලංකාවේ ජාතිකත්ව ගැටළුව හා සමාජ විපර්යාශය.** සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පීරිස්, රැල්ෆ් (1964). **සිංහල සමාජ සංවිධානය,** සමාජ ප්‍රකාශකයෝ, කොළඹ.

Amarasinghe, Nihal (1976). **An Overview of settlement schemes in Sri Lanka**, Asian Survey.

Barth F (1969). **Ethnic groups and Boundaries the Social organization of culture difference**; Bergen University, London.

Dissanayake. T.D.S, (1983). **The Agony of Sri Lanka in Depth Account of the Racial Riots of 1983**, Swastika ltd. Colombo 12

Ekanayake, E.M.S (2004). **A Sociological Study on the impact of the ethnic Conflict on Poverty, Poverty and Social Conflict in Sri Lanka**. (ed by Ronnate Asirwatham and Prashan Thalaysingam),Center for Poverty Analysis, Colombo.

Farmer, B.H (1957). **Pioneer peasant colonization in Ceylon**, Westport, Connecticut, Oxford University press.

Francis, E.K (1972). **The Nature of the Ethnic group**, American Sociological Review.

Larsen, Larissa etc. All (2004). Bonding and Bridging Understanding the Relationship between social capital and civic action, **Journal of planning education and research**, Association of collegiate Schools of planning.

Peebles, Patrick (1990). Colonization and Ethnic Conflict in the dry zone of Sri Lanka, **The Journal of Asian Studies**, 49 No. 01, Association for Asian studies Inc.

Ponnambalam, S (1983). **Sri Lanka: National Conflict and the Tamil Liberation struggle**, Zed books, London

Shils,E (1957). Primordial, Per sail, Sacred and Civil Ties, **British Journal of Sociology**.

Wilson A.J, (1972). **The Break up of Sri Lanka The Sinhalese – Tamil Conflict,** C.Hurst and company, London.